ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශාස්ත්‍රවේදී සිව්වන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 අගෝස්තු / සැප්තැම්බර්
ආර්ථික විද්‍යාව

# ECON 4121.03 – සංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම්කරණය

කාලය: පැය තුන (03) යි

පළමු කොටසින් ප්‍රශ්න තුනක් (03) හා දෙවන කොටසින් ප්‍රශ්න දෙකක් (02) තෝරාගෙන ප්‍රශ්න <u>පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න. සියලු ම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

පැහැදිලි අත්අකුරු පිළිබඳ සැලකිලිමත්වන්න.

## පළමු කොටස

01. i). අඩු දියුණු රටවල යටත්විජිත ආර්ථික ප්‍රතිපත්තිවල ඔබ හඳුනාගන්නා විශේෂතා මොනවාද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii). "අඩු දියුණු රටවල යටත්විජිත සමයේ හඳුන්වාදුන් ආර්ථික ප්‍රතිපත්ති එම ආර්ථිකයන්ගේ සංවර්ධන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි කරන ලද හඳුන්වාදීමක් නොවුනි." මෙම ප්‍රකාශය විභාග කරන්න.

(ලකුණු 09)

02. i). සංවර්ධන ප්‍රතිපත්තියක් වශයෙන් ආනයන ආදේශන කාර්මිකකරණ ප්‍රතිපත්ති අකාර්යක්ෂම වීමට බලපෑ හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii). "දකුණු කොරියානු ආර්ථිකය නැගීඑන ආර්ථිකයක් ලෙස ගොඩනැංවීමට ආනයන ආදේශන කාර්මිකකරණ ප්‍රතිපත්ති බලපෑවේය." මෙම ප්‍රකාශය සමඟ එකඟවන්නේ ද? පැහැදිලි කරන්න.

(ලකුණු 09)

03. i). රටක ආර්ථික සංවර්ධනය උදෙසා අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්තිවල අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii). "ආනයන ආදේශනයට සාපේක්ෂව අපනයන ප්‍රවර්ධනය කාර්යක්ෂමතාවෙන් ඉහළ සංවර්ධන උපායමාර්ගයකි." පැහැදිලි කරන්න.

(ලකුණු 09)

04. i). කෘෂිකාර්මික අංශය තුළ රජය වෙළෙඳපොළට මැදිහත්වීමට හේතු මොනවාද?

(ලකුණු 07)

ii). රටක ආර්ථික සංවර්ධනයේ දී පරිසරය නිසි පරිදි කළමනාකරණය කළ යුත්තේ ඇයි?

(ලකුණු 09)

## දෙවන කොටස

05. i). රටක සංවර්ධන සැලසුම්කරණයේ ප්‍රමුඛ අරමුණු මොනවාද?

(ලකුණු 07)

ii). "සංවර්ධන සැලසුමක් විස්තීර්ණ මෙන්ම ආංශික සැලසුමක් ද විය යුතු ය" විභාග කරන්න.

(ලකුණු 09)

06. i). සංවර්ධන සැලසුම් ක්‍රම මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii). ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලසුම්කරණයේ විශේෂතා මොනවාද? විචාරාත්මකව විමසන්න.

(ලකුණු 09)

07. i). ඉන්දියානු ආර්ථික සැලසුම්කරණයෙන් ශ්‍රී ලංකාවට ලබාගත හැකි පාඩම් මොනවද?

(ලකුණු 07)

ii). "දිගුකාලීන ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට ආර්ථික සැලසුම්කරණය යොදාගැනීමක් ඉන්දියානු ආර්ථිකයෙන් හඳුනාගත හැකිය" පැහැදිලි කරන්න.

(ලකුණු 09)

************